කර්මාන්ත අමාත්‍යාංශය

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

# සංස්ථාපිත සමාගම් වාර්ෂිකව ගොනු කළයුතු වාර්ෂික වාර්තා ඉදිරිපත් කළයුතු කාලය දීර්ඝ කිරීම

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සංස්ථාපිත සමාගම් අතරින් සමහරක් වාර්ෂිකව ගොනු කළයුතු වාර්ෂික වාර්තා (අංක 15/15A ආකෘති පත්‍ර) ගොනු නොකරන බව නිරීක්ෂණය වී ඇත.

සංස්ථාපිත සෑම සමාගමක්ම සමාගම් පනතේ 133(1) වගන්තිය යටතේ වාර්ෂික මහා සභා රැස්වීම පවත්වා වාර්ෂික වාර්තාව (අංක 15/15 A ආකෘති පත්‍ර මගින්) වැඩ කරන දින 30 ක් තුල සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත නියමිත ගාස්තුව ගෙවා භාර දිය යුතුය. වාර්ෂික රැස්වීමක් නොපවත්වන්නේ නම් සමාගම් පනතේ 144(3 )වගන්තිය අනුව ක්‍රියාකර වැඩ කරන දින 30 ක් තුල වාර්ෂික වාර්තාව සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය

ඒ අනුව මෙතෙක් වාර්ෂික වාර්තා ගොනු නොකරන ලද සමාගම් සඳහා 2024 ජනවාරි මස 01 දින සිට 2024 මාර්තු මස 31 දක්වා සහන කාලයක් ලබා දෙන අතර එම කාලය සඳහා සමථ මුදල් අයකරනු නොලැබේ.

එබැවින් සමාගම් පනත යටතේ සංස්ථාපිත සියළුම සමාගම්වල අධ්‍යක්ෂකවරුන්ට, ලේකම්වරුන්ට, ප්‍රවර්ධකයන්ට හා උනන්දුවක් දක්වන අනෙකුත් පාර්ශවයන්ට නියමිත කාලය තුල වාර්ෂික වාර්තා ගොනු කිරීමට වග බලාගන්නා ලෙස මෙයින් කාරුණිකව දැනුම් දෙමි.

සංජීව දිසානායක
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව